# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 5 ඒකකය |
|---|---|---|

## ගැළපුම් සටහන් සහිත මූල්‍ය ප්‍රකාශන

### I - කොටස

- **අංක 01 සිට 10 තෙක් දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

❖ සිතුම්ගේ ව්‍යාපාරයේ ගිණුම් කාලච්ඡේදය 2019.12.31 න් අවසන් වේ. එම වසරට අදාළ පහත තොරතුරු ඔබ වෙත ලබා දී ඇත. එම තොරතුරු ඇසුරින් 01 හා 02 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

- වසර තුළදී රු. 7 000 ක් වරිපනම් වියදම් ලෙස මුදලින් ගෙවා ඇති අතර රු. 2 000 ක වරිපනම් වියදමක් උපචිතව ඇත.
- 12% බැගින් පොළී ලැබෙන රු. 200 000 ක ස්ථාවර තැන්පතුවක් 2019.07.01 දින ආරම්භ කර ඇති අතර දෙසැම්බර් මාසය සඳහා වූ පොළී ආදායම් උපචිතව ඇත.

01. 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා වන ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී වරිපනම් වියදම් ලෙස ඇතුළත් කළ යුතු අගය වනුයේ,

    (1). රු. 7 000 (2). රු. 9 000 (3). රු. 5 000 (4). රු. 2 000

02. 2019.12.31 දිනට පිළියෙල කරනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ලැබිය යුතු පොළී ආදායම් ලෙස සටහන් කළ යුතු අගය වනුයේ,

    (1). රු. 24 000 (2). රු. 12 000 (3). රු. 2 000 (4). රු. 200 000

03. යම් ජංගම නොවන වත්කමක වාර්ෂික ක්ෂය ප්‍රමාණය තීරණය වීමට බලපාන සාධක ඇතුළත් නිවැරදි පිළිතුරු කාණ්ඩය වනුයේ,

    (1). වත්කමේ පිරිවැය, ඵලදායී ජීව කාලය, සුන්බුන් අගය
    (2). වත්කමේ ක්ෂය කළ හැකි අගය, ගෙන ඒමේ කුලී, සුන්බුන් අගය
    (3). වත්කමේ පිරිවැය, ස්ථාපිත කිරීමේ වියදම්, ගෙන ඒමේ කුලී
    (4). වත්කමේ පිරිවැය, සුන්බුන් අගය, ගෙන ඒමේ කුලී

04. ණයගැතියෙකු බුන්වත් වීම නිසා ලැබිය යුතු මුදල බොල්ණය වශයෙන් කපාහැරීම.

    (1). වත්කමකි (2). වියදමකි (3). ආදායමකි (4). වගකීමකි

05. ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරනු ලබන්නේ,

    (1). ලාභ හෝ අලාභ ප්‍රකාශයෙනි (3). මුදල් පොතෙනි
    (2). බැංකු සැසඳුම් විස්තරයෙනි (4). මූල්‍ය තත්ත්වය ප්‍රකාශයෙනි

- **පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සඳුනිගේ ව්‍යාපාරයේ 2019.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙන් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය | 200 000 |
| 2019.01.01 ඉතිරි තොගය | 15 000 |
| විකුණුම් | 550 000 |
| ගැණුම් | 225 000 |
| ගෙන ඒමේ කුලී | 25 000 |
| වරිපනම් වියදම් | 9 000 |
| වෙළෙඳ සේවක වැටුප් | 35 000 |
| බැංකු ණය පොළී | 7 000 |
| ණයගැතියෝ | 30 000 |
| දුන් වට්ටම් | 4 000 |
| බැංකු ණය | 700 000 |

අමතර තොරතුරු

- 2019 වසර සඳහා වරිපනම් වියදම් රු. 5 000 ක් ගෙවිය යුතුව ඇත.
- ණයගැතියන්ගෙන් රු. 2 000 ක් බොල්ණය ලෙස කපාහල යුතුය.
- 2019.12.31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු. 20 000 කි.

06. මෙම ව්‍යාපාරයේ විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය,

(1). රු. 265 000 (2). රු. 305 000 (3). රු. 245 000 (4). රු. 250 000

07. මෙම ව්‍යාපාරයේ 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ විකුණුම් පිරිවැය වනුයේ,

(1). රු. 265 000 (2). රු. 250 000 (3). රු. 245 000 (4). රු. 305 000

08. මෙම ව්‍යාපාරයේ දළ ලාභය වනුයේ,

(1). රු. 265 000 (2). රු. 305 000 (3). රු. 323 000 (4). රු. 245 000

09. මෙම ව්‍යාපාරයේ 2019.12.31 න් අවසන් වසරේ ශුද්ධ ලාභය,

(1). රු. 268 000 (2). රු. 305 000 (3). රු. 245 000 (4). රු. 243 000

10. මෙම ව්‍යාපාරයේ 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු ණයගැති වටිනාකම,

(1). රු. 30 000 (2). රු. 28 000 (3). රු. 32 000 (4). රු. 18 000

(ල. 2 × 10)

## II - කොටස

01. ව්‍යාපාරයක පරිපාලන කටයුතු සඳහා මිලදීගත් යන්ත්‍රයකට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| යන්ත්‍රයේ ගැණුම් මිල | රු. 500 000 |
| ප්‍රදර්ශනාගාරයේ සිට ගෙන ඒමේ කුලී | රු. 20 000 |
| සුන්බුන් අගය | රු. 35 000 |
| යන්ත්‍රය ස්ථාපිත කිරීමේ වියදම් | රු. 20 000 |
| යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ජීව කාලය වර්ෂ 10 | |

පහත දෑ ගණනය කරන්න.

(i). යන්ත්‍රයේ පිරිවැය.

(ii). යන්ත්‍රයේ ක්ෂය කළ හැකි අගය.

(iii). සරල මාර්ග ක්‍රමයට මෙම යන්ත්‍රය ක්ෂය කරන්නේ නම් වාර්ෂික ක්ෂය ප්‍රමාණය.

02. දිලිනිගේ ව්‍යාපාරයේ ගිණුම් කාලච්ඡේදය 2019.12.31 න් අවසන් වූ වර්ෂය වේ. ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත තොරතුරු ඔබ වෙත ලබා දී ඇත.

(1). ව්‍යාපාරයේ වාර්ෂික වරිපනම් ගාස්තුව රු. 10 000 ක් වුවද මුදලින් ගෙවා ඇත්තේ රු. 8 000 ක් පමණි.

(2). රු. 12 000 ක කුලී ආදායම් මුදලින් ලැබී ඇති අතර රු. 4 000 ක කුලී ආදායම් ලැබීමට ඇත.

(3). 2019.01.01 දින ලබාගත් 10% බැංකු ණය රු. 100 000 ක් වූ අතර ඒ සඳහා රු. 8 000 ක් පමණක් බැංකු ණය පොලී ලෙස ගෙවා ඇත.

ඉහත ගැළපුම් සටහන් සඳහා අදාළ ජ'නල් සටහන් ලියා දක්වන්න. (ල.6)

03. ජානකී ගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2019.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| ගැණුම් | 390 000 | |
| ගෙන ඒමේ කුලී | 10 000 | |
| විකුණුම් | | 580 000 |
| කුලී ආදායම් | | 10 000 |
| <u>පිරිවැයට</u> | | |
| ගොඩනැගිලි | 350 000 | |
| උපකරණ | 50 000 | |
| 2019.01.01 දිනට ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම් | | 30 500 |
| 2019.01.01 ඉතිරි තොගය | 10 000 | |
| දුන් වට්ටම් | 3 000 | |
| ලද වට්ටම් | | 5 500 |
| රක්ෂණය | 5 000 | |
| ප්‍රචාරණය | 25 500 | |
| 15% බැංකු ණය | | 53 000 |
| බැංකු ණය පොලී | 5 500 | |
| ණයගැතියෝ | 20 500 | |
| ණයහිමියෝ | | 20 000 |
| මුදල් | 29 500 | |
| 2019.01.01 දිනට ප්‍රාග්ධනය | | 200 000 |
| | 899 000 | 899 000 |

අමතර තොරතුරු

(1). 2019.12.31 දිනට ඉතිරි තොගය රු. 20 000

(2). රු. 2 000 ක ප්‍රචාරණ ගාස්තුවක් ගෙවිය යුතුව ඇත.

(3). ගොඩනැගිලි හා උපකරණ 10% බැගින් වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

(4). ණයගැතියන්ගෙන් රු. 1 000 ක් බොල්ණය කපාහැරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

(i). 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය.

(ii). 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.